

# පිළියම් කළ යුතුය දෙවරක් නොසිතාම

1 මං මාවත් පටුය ඒ යුගයේ — බිහිවූ
ඔරොත්තු නොදේ වාහන තරමට — වැඩිවූ
මාර්ග තදබදය මංමාවත් තුළ — පටු වූ
පරිසර - ආර්ථික ගැටළුවකට — මුල් වූ

2 රක්ෂිත සොරාගෙන ගේ දෙර ගොඩ — නගති
කඳු බෑවුම් පුරා ගොවිතැන් බත් — කරති
මං මාවත් දෙපස කුණු රොඩු ගොඩ — ගසති
සම්පත් නසා පරිසරයම ලෙඩ — කරති

3 ගංගා ඇළ දෙළේ හදවත කඳු — මුදුන
රුක් ගොමුවකින් සැරසී ගත් රස — අඳුන
හිත් පිත් නැති මිනිසුන් එහි දැව — හෙලන
දග ගෙයි ලැම අභියෝගෙකි සිත් — රැඳුන

4 වන සම්පත සම්පතකි රටකට — හැමදම
නෙත් සිත් වසග කරනා දසුනකි — බෝම
ඒ තුළ දිවි ගෙවන පිවින් — සුරැකීම
වගකීමයි කාගෙත් අත — හිතදීම

5 නෙක නෙක තුරු වැල් සත් හට සෙවන — දෙන
ඉදහිට වැටෙන වැහි දිය රැක දිය — පිරුණ
ගං හෝ වැව්, පොකුණු ඇළ දෙළ නිති — රකින
නොසිතෙද රැකිය යුතු වන පෙත් ලක් — දෙරණ

6 රුව ගුණ පිරුණ මනරම් වෙරළක් — උරුම
සිරිලක සිරිකතකි මහබඹුගෙ — මැවුම
මසුරන් වටී වෙරළේ සුන්දර — දැක්ම
වගකීමක් නොවෙද මේ සම්පත් — රැක්ම

7 වන පිවින් රකින බිම්කඩ — රක්ෂිතය
ගේ දෙර හද එය වැනසුම — විස්මිතය
ගහකොළ නසා ගොවිතැන් බත — වික්ෂිප්තය
රක්ෂිත නොරැකුනොත් වැනසුම — නිශ්චිතය

8 ගෝණුන්, මුවන්, සාවුන් දඩයමින් — නසා
වන පාළුවන් කරන නොපනත්කම් — ඉවසා
සිටිමුත් තවත් බැහැ ඉන්නට සිත් — සනසා
වන පිවින් රකිමු වන පාළුවො — වනසා

9 කඳු මත දිලෙන රුක් ගොමු නිල්ල — වගුරන
රුක්දෙව් විමන් වෘක්ෂයෝ වැහි එල — ගෙනෙන
මුලිනුපුටමින් ලී මෝලට රැගෙන — යන
ගෙල සිර කරමු වන පාළුවෝ දුටුව — තැන

10 සිරිලක ජෛව විවිධත්වය — සුරැකිම
තෙත්බිම් සේවයේ ගැඹුරැති — වගකීම
මැනවින් සිතා තෙත්බිම් අද — සුරැකීම
අවැසිය ඉටු කෙරුම කාගෙත් — වගකීම

**ඒ ඒ කුළතුංග**
**අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති සැළසුම්)**
**පරිසර අමාත්‍යාංශය**